ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.06.23

එල්. සුගන්ධිකා ෂාමිනී මිය
නො. 271,
වැලිපිල්ලා වත්ත පාර,
මාහේන, හොරණ.

*පැමිණිලි පාර්ශවය*

එදිරිව

01. කේ. වී. ශාලිකා මදුවන්ති මිය
උපගුරු,
බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලය,
හොරණ.

02. ඩී. පී. ඒ. සී. විතානගේ මිය
විදුහල්පති,
බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලය,
හොරණ.

03. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යපන කාර්යාලය, හොරණ.

04. එල්. ඩී. සුමනලතා මිය
කාන්තා උප පොලිස් පරීක්ෂක,
ස්ථානාධිපති,
ළමා හා කාන්තා කාර්යාංශය
පොලිස් ස්ථානය, හොරණ.

*වගඋත්තර පාර්ශවය*

**<u>පැමිණිලි අංකය : HRC/HO/1003/25</u>**

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය විසින් 2025.03.21 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් පහත පරිදි ඉදිරිපත් කර ඇත. තමාගේ වයස අවුරුදු 08 ක් වූ ජී. එච්. කේෂාන් පසිදු ෂාමින්ද නැමති වැඩිමහල් දරුවා බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ පළමුවන ශ්‍රේණියේ සිට අධ්‍යාපනය හදාර ඇති බවත් පළමු හා දෙවන ශ්‍රේණිවල පන්තිභාර ගුරුතුමිය ලෙස කේ.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වී. ශාලිකා මදුවන්ති මිය (පළමුවන වගඋත්තරකරු) ඉගැන්වීම් කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. 02 වන ශ්‍රේණිය මුල කාලය වන විට සිය දරුවා නිතර පාසල් යැමට නොහැකි බව ප්‍රකාශ කළ බවත් මේ කාලය තුළ වෙනදාට වඩා දරුවා තුළ කලබලකාරී ස්වභාවයක්, අමතකවීම, අධ්‍යාපන කටයුතු වලට අලස ස්වභාවයක් පෙන්නුම් කළ බව සඳහන් කර ඇත. දරුවාගේ මෙම ස්වභාවය පිළිබඳව තමා සිය දරුවාගෙන් විමසීමේ දී, දරුවා විසින් තමාට පාසල් යාමට නොහැකි බවත් එයට හේතුව ශාලිකා ගුරුතුමිය තමාට පාඩම් වැඩ බැරි බව පවසමින් නිතර බැන වදිමින් පහරදෙන බවත් ප්‍රකාශ කළ බව සඳහන් කර තිබේ. පසුව තමා මේ පිළිබඳව පන්තියේ අනෙකුත් දරුවන්ගෙන් සහ දෙමාපියන්ගෙන් විමසා බැලූ බවත්, එහිදී තම දරුවාට ශාලිකා ගුරුතුමිය නිතර බැන වදිමින් පහරදෙන බවට දැනගැනීමට ලැබුණු බව සඳහන් කර ඇත. මේවන විට තම දරුවා ශාලිකා ගුරුතුමියගේ පුද්ගලික උපකාරක පන්ති සඳහා ද සහභාගී වෙමින් සිටි බැවින් පසුව තමා එම පුද්ගලික උපකාරක පන්ති වලින් තම දරුවා ඉවත් කර ගත් බවත්, එසේ ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් ද පන්ති කාමරයේදී සිය දරුවාට "මල පොතේ අකුරක් බැරුව තමුසේ කොහෝමද පන්ති යන්නේ" යනුවෙන් ඉතා සැරපරුෂ ආකාරයෙන් බැනවැදී ඇති බව  සඳහන් කර තිබේ. මෙම සියලු සිදුවීම් දැනගත් පසු සිය සැමියා ශාලිකා ගුරුතුමිය හමුවී මේ පිළිබඳව විමසා සිටි බවත්, එසේ විමසීමේ ප්‍රතිඵලයක් ලෙස එදිනම සිය දරුවා පන්තියේ අනෙකුත් දරුවන්ගෙන් වෙන්කර පන්තියේ කෙලවර වෙනම ඩෙස් එකක සිය දරුවා වාඩිකරමින් "මගෙන් ගුටි කන්න බැරිනම් නැවත පාසල් නොයෙන ලෙස" බැනවැදී ඇති බවත් සඳහන් කර ඇත. සිය දරුවාට දිගින් දිගටම ශාලිකා ගුරුතුමිය විසින් සිදුකරනු ලබන කායික, මානසික අඩත්තේට්ටම් ඉවසාගත නොහැකි වූ බැවින් සිය දරුවා පාසලෙන් ඉවත් කර ගැනීම සඳහා විදුහල්පතිතුමිය හමුවී අස්වීමේ ලිපිය භාරදී ඉහත සිදුවීම් සියල්ල විදුහල්පතිතුමිය වෙත ප්‍රකාශ කළ බවත්, එවිට විදුහල්පතිතුමිය විසින් දරුවා තව නොබෝදිනකින් දරුවා 03 ශ්‍රේණියට  යන බැවින් 03 ශ්‍රේණිය පන්ති  භාර උදාරි ගුරුතුමිය ඉතා කරුණාවන්ත බැවින් 03 ශ්‍රේණියට දරුවා ඇතුළත් කරන තෙක් ඉවසා සිටින ලෙසත්, දරුවාගේ සියලු වගකීම් තමා ගන්නා බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. පසුව තමා 03 වසර නව පාසල් වාරය ආරම්භවන තෙක් සිය දරුවා පාසල් නොයවා සිටි බවත් 03 ශ්‍රේණිය ආරම්භ කළ පසු දරුවා එම පන්තියට ඇතුළත් කළ බවත් ප්‍රකාශ කර ඇත. පසුව දරුවා මාසයක් පමණ උදාරි ගුරුතුමිය සමීපයේ ඉතා ඉතා උනන්දුවෙන් සහ කැමැත්තෙන් පාසල් ගිය බවත් තමා දරුවාගේ නව පන්ති  භාර ගුරුතුමිය පිළිබඳ විමසීමේදී එම ගුරුවරිය ඉතා කරුණාවන්ත බව ප්‍රකාශ කළ බවත්, තමා ගුරුතුමියගෙන් ද සිය දරුවාගේ ඉගෙනුම් කටයුතු සම්බන්ධයෙන් විමසීමේදී තම දරුවා හොඳින් පාඩම් වැඩකටයුතු සිදුකරන බව ගුරුවරිය තමාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. 2025.03.11 දින 03 ශ්‍රේණියේ දරුවන් නර්ථන පුහුණුවීම් කටයුතු සඳහා ක්‍රීඩා පිටියට රැගෙන ගොස් ඇති අතර, මෙම අවස්ථාව සඳහා පන්ති භාර ගුරුතුමිය සහ තවත් ගුරුවරු කිහිපදෙනෙකු සහභාගී වී ඇත. මෙම පුහුණුවීම් අතරතුර මාගේ දරුවාගේ ඇගේ වැදී සෙව්මිය යන ගැහැණු දරුවා බිම වැටී ඇති බවත් එම අවස්ථාවේ එම සිදුවීම දුටු ශාලිකා මදුවන්ති (පළමුවන වගඋත්තරකරු) ගුරුවරිය එම ස්ථානයට පැමිණ සිය දරුවාගේ කම්මුලට පහරක් ගසා ඇති

බවත් එසේ පහර දෙනු පන්ති භාර ගුරුතුමිය දැක නොමැති බවත් සඳහන් කර ඇත. එම පහරදීමෙන් භීතියට හා පීඩාවට පත් සිය දරුවා හඬමින් පන්ති කාමරයට ගොස් ඇත. සවස නිවසට පැමිණ තම දරුවා "තමාගේ කණ රිදෙන බවත් කනෙන් දුම්දානවා වගේ දැනෙනවා" යනුවෙන් ප්‍රකාශ කළ බැවින් තමා විසින් දරුවාගේ කම්මුල පරීක්ෂා කිරීමේදී වම් පස කම්මුල රතුවී තිබෙනු දැකගත හැකි වූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව මේ පිළිබඳව දරුවාගෙන් විමසීමේදී ක්‍රීඩා පිටියේදී සිදුවූ සිදුවීම හා ශාලිකා ගුරුතුමිය තමාට පහරදුන් බව ප්‍රකාශ කළ බවත්, තමා එම අවස්ථාවේදීම හොරණ රෝහල වෙත සිය දරුවා රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. 2025.03.11 දින සිට 2025.03.14 දින දක්වා දරුවා නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත්, දරුවා රෝහල මගින් මානසික වෛද්‍යවරුයෙකු වෙත ද යොමු කිරීම සිදුකළ බවත් සඳහන කර තිබේ. තම සැමියා විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් 2025.03.12 දින හොරණ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ පැමිණිල්ලක් සිදුකළ බවත් එකී පැමිණිල්ල විභාය සඳහා දෙපාර්ශවයම 2025.03.15 වන දින කැඳවූ පසු ශාලිකා ගුරුතුමිය විසින් අසත්‍ය ප්‍රකාශ ලබාදීම හේතුවෙන් මෙම පැමිණිල්ල අධිකරණයට යොමුකරන මෙන් තමා ඉල්ලීම් කළ බව ද සඳහන් කර ඇත. එහෙත් ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරිනිය විසින් සති දෙකක් පමණ යන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත් තමා පොලිස් ස්ථානය වෙතින් දිගින් දිගටම විමසීම් සිදුකළ ද යහපත් ප්‍රතිචාරයක් තමාට නොලැබුණු බවත් සඳහන් කර ඇත. තමා විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් හොරණ කලාප කාර්යාලය වෙත ද 2025.03.14 දින වාචිකව පැමිණිලි බවත් නැවත 2025.04.02 දින ලිඛිතව ද පැමිණිල්ලක් යොමුකළ තමාට නමුත් සාධාරණයක් ඉටු නොවූ බැවින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත් අසාධාරණයට ගොදුරු වූ සිය කුඩා දරුවාට මෙන්ම අනාගතයේදී කිසිදු දරුවෙකුට එවැනි අසාධාරණයක් සිදු නොවීමට අවශ්‍ය නීතිමය පියවරයන් ගන්නා මෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

ඉහත පැමිණිල්ල ගොනුකිරීමෙන් පසු පැමිණිල්ල විභාගය සඳහා පළමුවන වගඋත්තරකරු වන ශාලිකා මදුවන්ති මිය, දෙවන වගඋත්තරකරු වන විදුහල්පති - බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලය සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය යන පාර්ශවයන් 2025.04.24 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවන ලදි.

**පළමුවන වගඋත්තරකරු - කේ. වී. ශාලිකා මදුවන්ති මිය (උපගුරු - බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලය)**

පළමුවන වගඋත්තරකරු වන කරන්නාගොඩ විතානගේ ශාලිකා මදුවන්ති යන අය 2025.04.24 දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. තමා 2019 වසරේ සිට බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ 01 සහ 02 යන ශ්‍රේණිවල පන්තිභාර ගුරුතුමිය වශයෙන් සේවය කරන බවත්, පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය වන කේශාන් පසිදු යන දරුවා පළමු වසරට

පැමිණි මුල් දවස්වල හොඳින් අධ්‍යාපන වැඩ කටයුතු කරගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. පළමු වසරේ මුල් කාලයේදී ඉගෙනුම් කටයුතු සඳහා පාට කිරීම වැනි කුඩා දේවල් තිබූ බවත්, අවුරුද්දේ මැද වන විට අකුරු ලිවීම වැනි සේ සිදු කිරීමට තිබූ බැවින් පෙර සිදු කළ වැඩ කොටසට වඩා වැඩි වැඩ කොටසක් සිදු කිරීමට වූ දරුවන්ට තිබූ බැවින් මෙම දරුවා ටිකක් මන්දගාමීව වැඩ කළ බව ප්‍රකාශ කර ඇත. පළමු ශ්‍රේණියේ මැදභාගයේ සිට දරුවාගේ පැමිණීමේ දුර්වලතා තිබූ බවත්, ඒ පිළිබඳව විමසන විට දරුවාට හතිය නැමති අසනීපයෙන් පෙළෙන බව දෙමාපියන් විසින් පාසලේ වට්සැප් සමූහය හරහා පණිවිඩ යොමුකර තිබූ බවත් ප්‍රකාශ කර ඇත. දරුවා ඉගෙනීමට දක්වන දුර්වලතා සම්බන්ධයෙන් තමා දෙමාපියන් දැනුවත් කර ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දුන් බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව දෙමාපියන් විසින් දරුවාගේ ඉගෙනුම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න බව තමාට පෙනුණු බව සඳහන් කර තිබේ. නමුත් පන්තිය තුළ මෙම දරුවා නිතරමුණු, නොසන්සුන්කාරී ආකාරයෙන් හැසිරෙන ආකාරයක් තමාට දැකගත හැකි වූ බවත්, ඉතා හෙමින් ඉගෙනුම් කටයුතු කරමින් අනිත් දරුවන්ට හිරිහැර කරමින් හැසිරීමට පටන් ගත් බැවින් තමා මෙම දරුවාට අවවාද කළ බවත් සඳහන් කර ඇත. 2025.03.12 වන දින පැවැත්වීමට නියමිතව තිබූ නායකත්ව පුහුණු වැඩසටහන සඳහා පාසලලේ සියලුම දරුවන් විසින් ඉදිරිපත් කිරීමට තිබූ නර්තන සඳහා අවසන් පුහුණුවීම් කටයුතු 2025.03.11 වන සිදුකළ බවත්, එකී පුහුණුවීම් කටයුතු පාසලේ ක්‍රීඩාපිටිය තුළ සිදුකළ බවත්, ගුරුවරුන් සියලු දෙනාම එම ස්ථානයේ රැඳී සිටිය බවත් ප්‍රකාශ කර ඇත. දවල් 11.00 ට පමණ 01 ශ්‍රේණිය, 02 ශ්‍රේණිය සහ 03 ශ්‍රේණිය යන පන්ති තුනටම නර්ථනය සඳහා සතුන්ගේ නැටුමක් පුහුණු කිරීමට යෙදී තිබූ බවත් 01 ශ්‍රේණියේ තමාගේ ළමයින් ටික ඉදිරියෙන් ද, ඉන්පසු 02 ශ්‍රේණියේ ළමයින් ද, ඊටත් පසු 03 ශ්‍රේණියේ දරුවන් ද සිටි නමුත් 03 ශ්‍රේණියේ පන්තිභාර ගුරුතුමියම අවස්ථාවේ සිට නොමැති බව ප්‍රකාශ කර ඇත. පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය වන කේශාන් දරුවා මෙම නර්තනය භාවෙක් සඳහා නර්ථනයේ යෙදෙන බව තමා දුටු බවත් එම දරුවා වරින් වර අනෙක් දරුවන් ඉස්සරහට තල්ලු කරන බව තමා දුටු බවත්, එම ස්ථානයේ සිටි අනෙකුත් දරුවන් ද ඒ ආකායට අනිත් දරුවන් තල්ලු කරනවා තමා දුටු බවත්, එවැනි හැසිරීම් ළමයින්ගේ සාමාන්‍යය ස්වභාවය බැවින් තමා එය එතරම් ගණන් නොගත් බවත් ප්‍රකාශ කර ඇත. මේ අතරතුර මෙම දරුවාගේ ඇඟේ හැපී සෙව්මි යන දරුවා බිම වැටුණු තමා දුටු බවත්, දරුවන් කීප දෙනෙක් පැමිණ තමාට ඒ පිළිබඳව දැනුම්දුන් බවත් එම දැරිය බිව වැටුණු වෙලාවෙ තමා එතනට ගොස් ළමයින් සිටි පේලි ටික නැවතත් දුරස් කරලා නැවත සකස් කිරීම පමණක් සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත. දවල් 12.00 පමණ විදුහල්පතිනිය එතනට පැමිණි අතර ප.ව. 1.30 පමණ පුහුණුවීම් කටයුතු අවසන් වූ බව සඳහන් කර ඇත. 2025.03.12 වන දින විදුහල්පතිනිය විසින් තමාට දුරකථන ඇමතුමක් ලබාදී, කේශාන් දරුවාට පහරදීම හේතුවෙන් දරුවා රෝහල්ගත කර ඇති බවත් විදුහල්පතිනිය එම දරුවා බැලීමට යන බවත් ඒ පිළිබඳ කලාපය දැනුවත් කරලා තියෙන බවත් තමාට ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. 2025.03.14 වන දින හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය වෙතින් ලද කැඳවීමට අනුව එහි ගිය බවත්, එහිදී කලාප කාර්යාලය විසින් තමාට අවවාද කළ බවත් සඳහන් කර ඇත. මෙම පහරදීම සම්බන්ධයෙන් දරුවාගේ දෙමාපියන් විසින් හොරණ පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනුකර ඇති

බවත්, 2025.03.15 වන දින පොලිස් ස්ථානයට ගොස් ප්‍රකාශයක් ලබාදුන් බවත්, පොලිසිය විසින් නීතිපති වෙත මෙම පැමිණිල්ල යොමුකර ඇති බවත් සඳහන් කර ඇත.

**දෙවන වගඋත්තරකරු - ඩී. පී. ඒ. සී. විතානගේ මිය (විදුහල්පති - බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලය)**

බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිනිය වන ඩී. පී. ඒ. සී. විතානගේ මිය 2025.04.24 දින කොමිෂන් සභාව ඉදිරියේ පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. තමා බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ 2015 වසරේ සිට සේවය කරන බවත් එම පාසලේ 01 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා පන්ති පවත්වාගෙන යන බවත් මේවන විට දරුවන් 186 දෙනෙක් අධ්‍යාපනය හදාරණ අතර ගුරුවරුන් 06 ඉගැන්වීම් කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කර ඇත. පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය වන කේෂාන් දරුවා 01 සහ 02 ශ්‍රේණිය ඉගෙන ගන්නා කාලය තුළ ගුරුවරුන්ගෙන් හෝ දෙමව්පියන්ගෙන් හෝ මෙම දරුවා පිළිබඳ විශේෂ යමක් තමාට වාර්තාවේ නොමැති බවත්, මෙම දරුවා පන්තිය තුළ හැසිරෙන ආකාරය පිළිබඳව හෝ අධ්‍යාපන කටයුතු පිළිබඳ හෝ විශේෂ වාර්තා වීමක් තමාට ලැබී නොමැති බවත් ප්‍රකාශ කර ඇත. 2025.01.27 හෝ ඊට ආසන්න දිනෙක මෙම දරුවාගේ දෙමාපියන් පැමිණ දරුවා පාසලෙන් අස් කර ගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කළ බවත් එම අවස්ථාවේ ඊට හේතුව විමසීමේදී, දරුවා ඉගෙනුම් කටයුතු වලට තරමක් දුර්වල වීම හේතුවෙන් ශාලිකා ගුරුතුමිය නිතරම දරුවාට බැන වදින බවත් ඇතැම් අවස්ථාවලදී දරුවාට පහරදී ඇති බවත් දෙමාපියන් විසින් තමාට ප්‍රකාශ කළ අතර, එම අවස්ථාවේදී තමා විසින් දරුවා ඉන් පසු 03 ශ්‍රේණියට ඇතුළත්වීමට සිටින බැවින් 03 ශ්‍රේණිය භාර ගුරුවරිය ගෙන් ගැටලුවක් ඇති නොවන බැවින් 03 ශ්‍රේණියට දරුවා ඇතුළත් කරන ලෙසත්, තමා දරුවාගේ සියලු වගකීම් ගන්නා බවත්, 03 ශ්‍රේණියට ඇතුළත් කර සති දෙකක් පමණ නිරීක්ෂණය කර ඉන් පසු සුදුසු තීරණයක් ගන්නා ලෙසත් තමා දෙමාපියන්ට දැනුම් දුන් පසු දෙමාපියන් එය පිළිගෙන නැවත පිටව ගිය බවක් ප්‍රකාශ කර ඇත. දෙමාපියන්ගේ මෙම දැනුම්දීමෙන් පසු තමා විසින් 01 සහ 02 ශ්රේණි භාර ශාලිකා ගුරුතුමිය වෙතින් මේ පිළිබඳව විමසීමක් සිදු නොකළ අතර, එයට හේතුව මීට පෙර එම ගුරුතුමිය පිළිබඳ වාචිකව හෝ ලිඛිතව පැමිණිල්ල තමාට ලැබී නොතිබීම බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් දෙමාපියන්ගේ එම දැනුවත් කිරීමෙන් පසු තමා විසින් ශාලිකා ගුරුතුමිය නිරීක්ෂණය කළ බවත්, එම නිරීක්ෂණ කාලය තුළ දරුවන්ට බැණ වැදීමක් හෝ පහරදීමක් තමාට නිරීක්ෂණ නොවූ බවත් සඳහන් කර ඇත. කේශාන් දරුවා 03 ශ්‍රේණියට ඇතුළත් කළ පසු තමා විසින් විශේෂයෙන් ඒ දරුවා පිළිබඳව අවධානයක් යොමු කළ බවත්, වරින්වර දරුවා සමඟ කතා කළ බවත් නියෝජ්‍ය විදුහල්පති වෙත ද මෙම දරුවා පිළිබඳ සැලකිලිමත් වන ලෙස දැනුම් දුන් බවත් ප්‍රකාශ කර ඇත. 03 ශ්‍රේණියට උදාරි ගුරුවරියට ද තමා විසින් මෙම දරුවාට ශාලිකා ගුරුවරියගෙන් හිරිහැර සිදුවී ඇති බව දරුවාගේ දෙමාපියන් දැනුම්දී ඇති බවින් විශේෂයෙන් ඒ දරුවා පිළිබඳ අවධානය යොමු කරන ලෙස දැනුම් දුන් බවත් සඳහන් කර ඇත. සති දෙකකට පමණ පසු තමා විසින් දෙමාපියන්ගෙන් දරුවාගේ ප්‍රගතිය පිළිබඳව විමසූ අවස්ථාවේදී දරුවා හොඳින් අධ්‍යාපන කටයුතු සිදුකරන බවත්, පාසලෙන් ඉවත් කර ගැනීමට අවශ්‍ය නොවන බව

දැනුම්දුන් බවත් සඳහන් කර ඇත.2025.03.12 වන දිනට පැවැත්වීමට නියමිතව තිබූ උත්සවයක් සඳහා සෑම පන්තියකම දරුවන්ට නර්ථනයක් පුහුණු කිරීම ගුරුවරුන් විසින් සිදු කළ අතර 2025.03.11 දින එහි අවසන් පුහුණු කිරීම් නැරඹීමට තමා ප.ව. 12.00 පමණ පාසලේ ක්‍රීඩා පිට්ටනිය වෙත ගිය බවත්, එම අවස්ථාවේ මේ දරුවාට පහරදීමක් සිදුවී ඇති බවට කිසිදු කෙනෙක් විසින් තමාට වාර්තා නොකළ බව සඳහන් කර ඇත. එදිනම සවස 4.45 ට පමණ කේශාන් දරුවාගේ පියා තමා වෙත දුරකථන ඇමතුමක් ලබාදී 01 සහ 02 ශ්‍රේණි භාර ශාලිකා ගුරුවරිය විසින් සිය දරුවාට පහරදී ඇති බවත්, ඒ හේතුවෙන් දරුවා රෝහල් ගත කළ බව දැනුම්දුන් බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී තමා විසින් දරුවාගේ පියා වෙත තමා මේ පිළිබඳව සොයාබලන බව දැනුවත් කර නියෝජ්‍ය විදුහල්පතිතුමා සමඟ 2025.03.11 දින රෝහල වෙත ගිය බවත්, එහිදී තමා විසින් දරුවා පරීක්ෂා කළ අතර දරුවාගේ වම් කම්මුල රතුවී තිබෙණු තමා දුටු බවත්, දරුවා සමග කතා කිරීමේදී "දරුවා විසින් තමා නර්ථනයේ යෙදෙන අවස්ථාවේදී තමා සහ සෙව්මි යන දැරිය එකට හැප්පුණු බවත් ඒ අවස්ථාවේ සෙව්මි බිම වැටුණු බවත්, ශාලික ගුරුතුමිය පැමිණ තමාගේ කම්මුලට පහරක් ගැසූ බවත්" තමාට ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. දෙමාපියන් සමගද සාකච්ඡා කර නැවත පැමිණ එදින රාත්‍රියේදී තමා ශාලිකා ගුරුතුමියට දුරකථනයෙන් අමතා මෙකී පහරදීම පිළිබඳව විමසීමේදී, ශාලිකා ගුරුවරිය විසින් දරුවාට පහර නොදුන් බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. 2025.03.12 දින පාසලේදී ද නැවත ශාලිකා ගුරුතුමිය වෙතින් මේ පිළිබඳව විමසූ අතර එවැනි පහරදීමක් සිදු නොකළ බව එම ගුරුවරිය විසින් ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව තමා 2025.03.13 වන දින පාසලේ දරුවන් වෙන් වෙන් වශයෙන් කැඳවා කේශාන් දරුවාට ශාලිකා ගුරුතුමිය විසින් පහරදෙනු කිසිවෙකු විසින් දැක තිබේද යන්න විමසා සිටි බවත්, එහිදී දරුවන් ශාලිකා ගුරුවරිය විසින් එවැනි පහරදීමක් සිදු නොකළ බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. 2024.03.14 දින හොරණ කලාප කාර්යාලය වෙතින් තමාට දුරකථන ඇමතුමක් ලබාදී පැමිණෙන ලෙස දැනුම්දුන් අතර, එදින කලාප කාර්යාලය වෙත ගොස් කට උත්තරයක් ලබාදුන් බවත් ශාලිකා ගුරුවරිය ද එදින කලාප කාර්යාලය වෙත ගිය අතර, එම ගුරුවරියට කලාප කාර්යාලය විසින් වාචිකව අවවාද කළ බවත් සඳහන් කර ඇත. කේශාන් දරුවාගේ දෙමාපියන් විසින් හොරණ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය වෙත පැමිණිල්ලක් සිදුකර තිබූ බැවින් 2025.03.15 දින පොලිස් ස්ථානය වෙත ගොස් කට උත්තරයක් ලබා දුන් බව සඳහන් කර ඇත. තවද මෙම දරුවා මේවන විට වෙනත් පාසලකට ඇතුළත් කර අධ්‍යාපන කටයුතු හදාරන බව ද සඳහන් කර ඇත.

**තෙවන වගඋත්තර පාර්ශවය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය**

මෙම පැමිණිල්ල විභාග කිරීම සඳහා 2025.04.24 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණෙන ලෙස දැනුම්දී තිබුණ ද හේතු දැක්වීමකින් තොරව එදින පැමිණිල්ල විභාගය සඳහා පැමිණ නොමැත. 2025.05.19 දිනැතිව ජේ. ඩී. එල්. වී. කේ. ජාසිංහ මයා (කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ) විසින් කොමිෂන් සභාවේ ලිඛිත දැනුම්දීම පරිදි කෙටි ලිපියක් පමණක් යොමුකරමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත.

එකී ලිපියෙහි සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරිය විසින් බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරියක් විසින් තම දරුවාට පහරදීමක් සිදුකර ඇති බවට නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් පරිපාලන) වෙත වාචිකව පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එකී පැමිණිල්ල ලිඛිතව ලබාදෙන මෙන් පැමිණිලිකාරිය වෙත දැනුම්දී ඇති බවත් සඳහන් කර ඇත. තවද මෙම ගැටලුව විසඳීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බවත්, දරුවා නැවත පාසල් යැවීමට කටයුතු කරන ලෙස පැමිණිලිකාරිය වෙත උපදෙස් ලබාදුන් බවත් සඳහන් කර තිබේ. පසුව මේ පිළිබඳව විමසීම සඳහා බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ ශාලිකා නැමති ගුරුවරිය සහ එම විදුහලේ විදුහල්පතිවරිය 2025.03.14 දින කලාප කාර්යාලය වෙත කැඳවූ බවත්, එහිදී ශාලිකා ගුරුවරිය වෙත දැඩි ලෙස අවවාද කළ බවත් සඳහන් කර ඇත. තවද තම පාසලේ ගුරුභවතුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් නිරන්තරයෙන් අධීක්ෂණය කර ගැටලු සිදුනොවන ආකාරයෙන් පාසල තුළ කටයුතු කළ යුතු බවට ගුරුභවතුන් දැනුවත් කර ලෙස විදුහල්පතිවරිය වෙත ද උපදෙස් ලබාදුන් බව සඳහන් කර ඇත. එමෙන්ම උක්ත පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකාරිය 2025.04.02 දින නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් පරිපාලන) හමුවී දරුවා පාසලට යාම ප්‍රතික්ෂේප කරන බව දන්වා ලිඛිත පැමිණිල්ලක් ලබාදුන් බවත්, එම අවස්ථාවේදී දරුවාහට වෙනත් පාසලක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමේදී පැමිණිලිකාරියගේ කැමැත්ත පරිදි මෙම දරුවාට බප/හො/ලබුගම විජිත කනිෂ්ඨ විද්‍යාලයේ 03 ශ්‍රේණියට ඇතුළත් කිරීමට අවශ්‍ය ලිපිය එදිනම ලබාදීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත.

**සිව්වන වගඋත්තරකරු - කා. උ. පො. ප. එල්. ඩී. සුමනලතා මිය (ස්ථානාධිපති - ළමා හා කාන්තා කාර්යාංශය, හොරණ පොලිස් ස්ථානය)**

2025.05.15 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කාන්තා උප පොලිස් පරික්ෂක එල්. ඩී. සුමනලතා මිය පැමිණිල්ල විභාග කිරීම සඳහා කැඳවා ඇති අතර, එදින එම නිලධාරිනිය විසින් පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත.

තමා හොරණ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති ලෙස වසර 09 ක් සේවය කරන බව සඳහන් කර ඇත. 2025.03.12 වන දින හොරණ මූලික රෝහලේ රාජකාරී කටයුතු වල නියුතු පො. සැ. 44262 පුංචි බණ්ඩා නිලධාරියා විසින් එම මූලික රෝහලේ 14 වෙනි වාට්ටුවේ ප්‍රතිකාර ලබන බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ 03 ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේශාන් පසිදු නැමති දරුවාට එම විදුහලේ ගුරුවරියක් විසින් පහරදීම හේතුවෙන් ප්‍රතිකාර ලබන බවත්, එම වින්දිත දරුවාගෙන් ප්‍රකාශයක් ලබාගෙන විවිධ පැමිණිලි අංශයේ II තොරතුරු සටහන් පොතේ අලවා ඇති බව සඳහන් කර ඇත. එදිනම පැය 12.10 ට එම දරුවාගේ පියා විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ශාලිකා ගුරුතුමිය විසින් තම දරුවාට පහර දුන් බව සඳහන් කරමින් පැමිණිල්ලක් යොමු කර තිබූ අතර 2025.03.12 දින පැය 16.30 ට තමා සහ කා. පො. කො. 9208 ඉශාන්ති නිලධාරිනිය සමග මෙකී පහරදීම සිදුවූ බවට සඳහන් කර ඇති බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ ක්‍රීඩා පිටියට ගොස්

නිරීක්ෂණය කළ බවත් එම අවස්ථාවේදී එහි කිසිවෙකු නොසිටි බවත් අදාළ ස්ථානයේ දළ සටහනක් ඇඳ ස්ථානයට පැමිණ නිරීක්ෂණ සටහන් යෙදූ බවත් සඳහන් කර ඇත. මෙම පැමිණිල්ල විභාග කිරීම සඳහා 2025.03.15 දින වින්දිත් දරුවා සහ දෙමාපියන් ද වගන්තර පාර්ශ්වය ද පොලිස් ස්ථානය වෙත කැඳවා ඇත ප්‍රකාශ සටහන් කිරීම සිදුකළ බව සඳහන් කර ඇත. මෙම පැමිණිල්ලේ සඳහන් කේශාන් දරුවාගේ ඇගේ හැපී වැටුණු බවට දක්වා ඇති සෙව්මි යන දැරියගෙන් ද එදිනම ප්‍රකාශයක් ලබාගත් බවත්, මෙම පැමිණිල්ලට අදාළව වැඩිදුර සාක්ෂි සටහන් කර ගැනීම 2025.05.10 දින සිදු කළ බවත් මෙම සිදුවීම සිදුවූ දින ක්‍රීඩා පිටියේ වින්දිත දරුවා අසල රැඳී සිටි දරුවන් සිව්දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීම සිදුකළ බව සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිල්ලට අදාළ විමර්ශන කටයුතු මෙදින අවසන් වූ බැවින් ස්ථානාධිපතිතුමාගේ උපදෙස් පරිදි විදිත් දරුවාගේ වෛද්‍ය වාර්තාව ද සමග උද්‍ධෘත ගොනුවක් සකස් කර අධිකරණය මගින් නීතිපතිතුමාගේ උපදෙස් සඳහා යොමු කළ බවත් සඳහන් කර ඇත.

**කරුණු විමසීම:**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2025.04.24 දින උක්ත පැමිණිල්ල විභාගය සඳහා වින්දිත දරුවා ඒ වන විට ඉගෙනුම ලබන 03 ශ්‍රේණිය පන්තිභාර ගුරුවරිය කොමිෂන් සභාව වෙත කැඳවන ලදි. ඒ අනුව කේ. යූ. අයි. බණ්ඩාර මිය විසින් පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත.

තමා 2012 දෙසැම්බර් මාසයේ සිට බප/හො/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ සේවය කරන බවත් තමා විසින් 03 සහ 04 ශ්‍රේණිවල දරුවන්ට ඉගැන්වීම් කටයුතුව සිදුකළ බවත් මෙම සිදුවීම් වන කාලයේදී තමා 03 ශ්‍රේණිය භාර ගුරුවරිය වශයෙන් කටයුතු කළ බවත් ප්‍රකාශ කර ඇත. පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය වන කේශාන් පසිඳු දරුවා 03 ශ්‍රේණියට තමා භාරගත් බවත් තමා මෙම දරුවා සමග මාස දෙකක් පමණ කාලයක් ඉගෙනුම් කටයුතු සිදු කළ බවත් සඳහන් කර ඇත. එම කාලය තුළ මෙම දරුවා අනෙක් දරුවන් මෙන් සාමාන්‍යය ආකාරයෙන් ඉගෙනුම් කටයුතු සිදුකළ බවත් අකුරු ලිවීමේ සහ කියවීමේ, ලිවීමේ යම් දුර්වලතා තිබූ බැවින් තමා විසින් ඒ සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීම සිදුකළ බවත් සඳහන් කර ඇත. තමාගේ පන්ති කාමරය තුළ සිටින කාලය තුළදී මෙම දරුවා තුළින් කිසිදු ආවේගශීලයේ හැසිරීමක් හෝ පන්තියේ ළමුන්ට හිරිහැර සිදුවන ආකාරයෙන් හැසිරීමක් පෙන්නුම් නොකළ බවත් ප්‍රකාශ කර ඇත. මෙම වයසේ සාමාන්‍යයෙන් දරුවන් තුළින් දැකගත හැකි හැසිරීම් රටාව මේ දරුවා තුළින්ද දැකගැනීමට ලැබුණු බවත්, තමා සමග ඉගෙන ගත් මාස දෙකක කාලය තුළ දරුවා ඉතා කැමැත්තෙන් පන්තියට පැමිණි බවත් සඳහන් කර ඇත. 2025.03.11 දින 03 ශ්‍රේණියේ දරුවන්ට නර්තනයක් පුහුණුවීමට තිබූ අතර එදින තමාට 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ළමුන්ගේ සහතික සකස් කිරීමට තිබූ බැවින් තමා විසින් 02 ශ්‍රේණිය ගුරුතුමියට තමාගේ පන්තියේ දරුවන්ගේ පුහුණුවීම් බලන ලෙස සඳහන් කර තමා ඉහත කටයුත්තේ යෙදුණු බවත් ප්‍රකාශ කර ඇත. තමා පෙ.ව. 11.30 ට පමණ පුහුණුවීම් සිදුකළ ක්‍රීඩා පිටිය වෙත ගිය නමුත් ශාලිකා ගුරුතුමිය දරුවාට පහර දීමක් සිදුකර තිබේද යන්න තමා නොදුටු බවත්, ප.ව. 12.45 ට පමණ නර්තන පුහුණුවීම් කටයුතු අවසන් වී දරුවන් නිවෙස වලට ගිය බවත්, මෙම දරුවා සම්බන්ධයෙන් විශේෂයෙන් එදින යමක් තමා නුදුටු

බවත් ප්‍රකාශ කර ඇත. එදින සවස තමාගේ පන්තියේ දරුවකුගේ මවක් විසින් තමාට දුරකථන ඇමතුමක් ලබාදී කේශාන් දරුවාට ශාලිකා ගුරුතුමිය ක්‍රීඩා පිටියේදී කම්මුලට පහරදී ඇති දැනුම්දුන් බව ප්‍රකාශ කර ඇත. එහෙත් ඒවන තෙක් තමා මෙම සිදුවීම පිළිබඳව දැන නොසිටි බවත් මේ වන විට දරුවා රෝහල් ගතවී සිටින බව ඇමතුම ලබාදුන් මව විසින් තමාට ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. එම අවස්ථාවේදීම තමා විදුහල්පතිනියට ඇමතුමක් ලබා දී ඒ පිළිබඳව විමසූ බවත්, විදුහල්පතිනිය විසින් තමාට මෙම ප්‍රශ්නයට මැදිහත් නොවන ලෙස දැනුම්දුන් බැවින්, තමා ඒ පිළිබඳව සෙවීමට නොගිය බවත් සඳහන් කර ඇත. එදින රාත්‍රියේ වින්දිත දරුවාගේ මව තමාට දුරකථන ඇමතුමක් ලබාදී අදාළ සිදුවීම ප්‍රකාශ කළ බවත්, තමා විසින් දරුවාගේ සුවදුක් විමසා මවට උපදෙස් ලබාදුන් බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් තමාට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි බැවින් තමා නිහඬව සිටි බවත්, මේ පිළිබඳව තමා කිසිවෙකු සමග කතා නොකළ බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීමෙන් සතියකට පමණ පසු වින්දිත දරුවාගේ මව පැමිණ දරුවා පාසලෙන් ඉවත් කරගෙන යාම සඳහා දරුවාගේ පොත් පත් රැගෙන ගිය බවත් තමා මේවන විට 03 ශ්‍රේණිය පන්ති භාර ගුරුවරිය ලෙස කටයුතු නොකරන බව සඳහන් කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීම:**

පැමිණිලිකාරිය විසින් 2025.03.11 දින හොරණ මූලික රෝහල වෙත ගොස් කේශාන් පසිඳු දරුවා සඳහා ප්‍රතිකාර ලබාගෙන ඇත. එහිදී අධිකරණ වෛද්‍යවරයා විසින් දරුවා පරීක්ෂා කර ඇති අතර කොමිෂන් සභාව විසින් 2024.04.24 දිනැතිව අදාළ වෛද්‍ය වාර්තාව යොමුකරන ලෙස ලිඛිතව දැනුම් දෙන ලදි. ඒ අනුව 2025.05.09 දිනැතිව අදාළ වෛද්‍ය වාර්තාව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකර තිබේ. එම වාර්තාවේ දක්වා ඇති කරුණු පහත පරිදි වේ.

අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි රෝගියා විසින් ලබාදෙන ලද කෙටි රෝග ඉතිහාසය යන්නෙහි, වින්දිත දරුවා විසින් ලබාදෙන ලද ප්‍රකාශය ලෙස, "2025.03.11 දින කෑම විවේකයට පසු තමා නර්තන පුහුණුවීම් සඳහා ක්‍රීඩා පිටියට ගිය බවත් තමා එම නර්තනයේ හාවෙක් සඳහා පෙනී සිටි බවත්, එම ස්ථානයේ සිංහයන් ලෙස සිටි දරුවන් තමා බියට පත් කළ බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී අසල නර්තනය පුහුණුවෙමින් සිටි ගැහැණු ළමයෙක්ගෙ ඇගේ තමා වැරදීමකින් හැපුණු බවත්, එසේ හැපීම හේතුවෙන් එම ගැහැණු ළමයා බිම වැටුණු බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී එකී ගැහැණු ළමයා බියට පත් වූ බැවින්, තමා විසින් එම ගැහැණු දරුවා තල්ලු කළ බව එම ගැහැණු ළමයා විසින් ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී පළමු වසරේ ගුරුතුමිය පැමිණ තමාගේ කම්මුලට පහරක් ගැසූ බවත්, ඉන් තමාගේ කම්මුලෙන් අධික වේදනාවක් දැණුනු බවට "ප්‍රකාශ කළ බව එහි සටහන් කර ඇත. මෙකී තොරතුරු අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත දරුවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව පහත සඳහන් රෝග නිරීක්ෂණ සටහන් කර තිබේ.

- වම් කම්මුලෙහි tempero – mandibular joint area එකෙහි අසාපී බිඳීමක් හෝ අස්ථි වෙන්වීමක් සිදුවී නොමැති නමුත් එම ස්ථානයෙහි ඉදිමුමක්/ තද ගතියක් දැකගත හැක.

(Tenderness in the left side tempero – mandibular joint area, with no underlying fractuers or dislocations.)

අධිකරණ වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් දරණ මතය ලෙස, “අංක 01 මගින් දක්වා ඇති තුවාල ස්වභාවය මොට බලයක් යෙදීම හේතුවෙන් සිදුවී ඇති අතර, පරීක්ෂණය මගින් අනාවරණය කර ගන්නා ලද තුවාල ස්වභාවය රෝගියා විසින් ලබාදෙන ලද රෝග ඉතිහාසය හා ගැළපේ. (Injury No. 01 was coused by a blunt force. Examination findings are compatible with the given history) යනුවෙන් සඳහන් කර ඇත.

තවද මෙම වින්දිත දරුවා මනෝ වෛද්‍යවරුයෙකු වෙත යොමු කර ඇති අතර, විශේෂඥ මනෝවෛද්‍ය උපදෙස් අනුව, මෙම සිදුවීමෙන් පසු ඇති වූ මානසික බලපෑම් දරුවා තුළ පවතින බව (Psychological after - effects following the incident are present) සඳහන් කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වූ කරුණු :**

- පැමිණිල්ලෙහි දක්වා ඇති පරිදි පැමිණිලිකාරියගේ වයස අවුරුදු 08 ක් වූ කේශාන් පසිදු දරුවා විසින්, මෙම සිදුවීම සිදුවූ දින එනම් 2025.03.11 දින පාසල අවසන්වී නිවසට පැමිණ ශාලිකා ගුරුතුමිය විසින් තමාට පහරදුන්නා යැයි පැවසූ බව පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. වින්දිත දරුවාගේ එම ප්‍රකාශනය මෙම පැමිණිල්ලේ වැදගත් සාක්ෂියක් ලෙස නිරීක්ෂණය වේ. තවද එම අවස්ථාවේදීම පැමිණිලිකාරිය වන දරුවාගේ මව වින්දිත දරුවා පරික්ෂා කර ඇති අතර, එම අවස්ථාවේදී දරුවාගේ වම් කම්මුල රතුවී ඇති බවට සලකුණු පැමිණිලිකාරිය විසින් දුටු බව සඳහන් කර ඇත. එම සාක්ෂිය මෙවැනි පහරදීමක් සිදුවී ඇද්ද යන්න සම්බන්ධයෙන් පළමු වරට නිරීක්ෂණය කරන ලද ඇසින්දුටු සාක්ෂියක් බවට පැහැදිලි වේ.
- දෙවන වගඋත්තරකරු වන බප/හෝ/හැගල්ල ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිනිය 2025.03.11 දින එනම් මෙකී පහරදීම සිදුවූ දින රෝහලට පැමිණ වින්දිත දරුවා නිරීක්ෂණය කර ඇති අතර, එහිදී දරුවා පරීක්ෂා කිරීමේදී දරුවාගේ වම් කම්මුල රතුවී තිබෙණු තමා දුටු බවත්, දරුවා සමග කතා කිරීමේදී “දරුවා විසින් තමා නර්ථනයේ යෙදෙන අවස්ථාවේදී තමා සහ සෙව්මි යන දැරිය එකට හැප්පුණු බවත් ඒ අවස්ථාවේ සෙව්මි බිම වැටුණු බවත්, ශාලික ගුරුතුමිය පැමිණ තමාගේ කම්මුලට පහරක් ගැසූ බවත්” තමාට ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. ඒ අනුව එම සාක්ෂිය මෙවැනි පහරදීමක් සිදුවී ඇති බව බාහිර පුද්ගලයෙකු විසින් නිරීක්ෂණ කරන ලද වැදගත් සාක්ෂිය වන බව පෙනීයයි.
- පළමුවන වගඋත්තරකරු වන ශාලිකා මදුවන්ති මිය විසින් වින්දිත දරුවා පන්ති කාමරය තුළදී නොසන්සුන්කාරී ආකාරයෙන් හැසිරෙන බවත්, අනෙකුත් දරුවන්ට හිරිහැර සිදුකරන බවට ප්‍රකාශ කර ඇති නමුත්, එම දරුවා සම්බන්ධයෙන් 03 ශ්‍රේණිය පන්ති භාර ගුරුවරිය විසින් “කේශාන් පසිඳු දරුවා 03 ශ්‍රේණියට තමා භාරගත් පසු තමා සමග මාස දෙකක් පමණ කාලයක්

ඉගෙනුම් කටයුතු සිදු කළ බවත්, එම කාලය තුළ මෙම දරුවා අනෙක් දරුවන් මෙන් සාමාන්‍යය ආකාරයෙන් ඉගෙනුම් කටයුතු සිදුකළ බවත්, පන්ති කාමරය තුළදී කිසිදු ආවේගශීලයේ හැසිරීමක් හෝ පන්තියේ ළමුන්ට හිරිහැර සිදුවන ආකාරයෙන් හැසිරීමක් පෙන්නුම් නොකළ බවත්, මෙම වයසේ සාමාන්‍යයෙන් දරුවන් තුළින් දැකගත හැකි හැසිරීම් රටාව මේ දරුවා තුළින්ද දැකගැනීමට ලැබුණු බවත්, තමා සමග ඉගෙන ගත් මාස දෙකක කාලය තුළ දරුවා ඉතා කැමැත්තෙන් පන්තියට පැමිණි බවත්" සඳහන් කර ඇත. 03 ශ්‍රේණියට ඇතුළත් කළ පසු දරුවා හොඳින් ඉගෙනුම් වැඩකටයුතු සිදුකළ බව දෙමාපියන් විසින් ද සඳහන් කර ඇති අතර, විදුහල්පතිතුමිය වෙත ද ඒ පිළිබඳ දැනුම්දුන් බව දෙවන වගඋත්තරකරුවන විදුහල්පතිතුමිය විසින් ද සඳහන් කර තිබේ. මෙමගින් පෙනී යන්නනේ, 02 ශ්‍රේණියේ සිට දරුවා අකමැත්තෙන් සහ මානසික පසුබෑමකින් පාසල් ගොස් ඇති බවත් 03 ශ්‍රේණියට ඇතුළත් වූ පසු එම පන්තියේ ගුරුතුමියගේ කාරුණිකභාවය හේතුවෙන් දරුවා ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් සිටි බවත් ය. ඒ අනුව වින්දිත දරුවා 02 ශ්රේණියේ ශාලිකා ගුරුතුමිය සමග ඉගෙනුම් කටයුතු සිදුකරන කාලය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයට මුහුණදී තිබීම හේතුවෙන් එය දරුවාට මානසිකත්වයට බලපා තිබී ඇති අතර, දෙමාපියන් ප්‍රකාශ කළ ආකාරයට දරුවා තුළින් ආවේගකාරී හැසිරීම් රාටාවක් එම කාලය තුළ දැකගත හැකිවී ඇත්තේ එම හේතුව නිසා විය හැකි බව පෙනීයයි.

**නිරීක්ෂණ :**

- සිය දරුවාට පළමුවන වගඋත්තකරු වන ශාලිකා ගුරුතුමිය විසින් නිරන්තරයෙන් බැන වැදීම පහරදීම හේතුවෙන් දරුවා පාසලෙන් ඉවත් කර ගන්නා බව දෙමාපියන් විසින් විදුහල්පතිනිය වෙත 2025.01.27 හෝ ඊට ආසන්න දිනකදී දැනුම්දී ඇත. එම අවස්ථාවේදී විදුහල්පතිනිය විසින් අදාළ ගුරුවරියගෙන් මේ පිළිබඳ විමසීමක් සිදුකර නොමැත. ඒ වෙනුවට විදුහල්පතිනිය විසින් අදාළ වගඋත්තරකාර ගුරුවරිය නිරීක්ෂණය කිරීම පමණක් සිදුකර ඇත. වින්දිත දරුවා 2025.03.11 දින වගඋත්තරකාර ගුරුවරිය වෙතින් පහකෑමට ලක්වන තෙක් විදුහල්පතිනිය විසින් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව පැහැදිලිව නිරීක්ෂණය වේ. පාසලක පරිපාලනය, විනය සම්බන්ධයෙන් මෙන්ම සිසු දරුවන්ගේ සුභසිද්ධිය උදෙසා වගකිව යුතු පළමු නිලධාරිනිය වශයෙන් මෙම දෙමාපියන් විසින් වගඋත්තරකාර ගුරුවරියගේ ක්‍රියාකලාපය පිළිබඳ දැනුම්දුන් පළමු අවස්ථාවේදී ම සොයාබලා නිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදුකළේ නම්, මාස දෙකකට පමණ පසු සිදුවූ මෙම පහරදීම වළක්වා ගැනීමේ හැකියාව තිබූ බව පැහැදිලිව නිරීක්ෂණය වේ. ඒ අනුව දෙවන වගඋත්තරකරු වන මෙම පාසලේ විදුහල්පතිනිය විසින් සිය වගකීම් පැහැර හරමින් නොසැලකිලිමත් ආකාරයෙන් කටයුතු කර ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

- දෙවන වගඋත්තරකරු වන විදුහල්පතිනිය විසින් 03 ශ්‍රේණියේ පන්ති භාර උදාරි ගුරුවරියහට මෙම වින්දිත දරුවා ශාලිකා ගුරුවරිය වෙතින් හිරිහැර වලට භාජනය වූ දරුවෙක් වන බැවින්

මෙම දරුවා කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන මෙන් දැනුම්දුන් බව ප්‍රකාශ කර ඇති නමුත්, එම ගුරුවරිය එවැනි දැනුවත්වීමක් සිදුවී ඇති බවට සඳහන් කර නොමැත. 2025.03.11 දින වින්දිත දරුවාට ශාලිකා ගුරුවරිය විසින් පහරදී ඇති බවට පන්තියේ වෙනත් දරුවෙකුගේ මවක් විසින් 03 ශ්‍රේණිය පන්ති භාර උදාරි ගුරුවරියට දැනුම්දුන් අවස්ථාවේදී ඒ පිළිබඳව විමසීමේදී, විදුහල්පතිවරිය විසින් මෙකී ප්‍රශ්න වලින් තමාට ඉවත්ව සිටින ලෙස දැනුම්දුන් බැවින් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට පන්තිභාර ගුරුවරිය වශයෙන් තමාට නොහැකි වූ කොමිෂන් සභාව වෙත සඳහන් කර ඇත. මෙමගින් ද පෙනී යන්නේ දෙවන වගඋත්තරකාර විදුහල්පතිවරිය විසින් මෙම ගැටලුවේදී ඒකාධිකාරී බලයක් පවත්වාගෙන යාමට උත්සාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

- තෙවන වගඋත්තර පාර්ශවය වන හොරණ කලාප කාර්යාලය මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සතුටුදායක නොවේ. මන්දයත් මෙම සිදුවීම වාර්තා වූ පසු අදාළ වගඋත්තරකාර ගුරුවරිය කැඳවා අවවාද දීම පමණක් සිදුකර ඇති අතර, විමර්ශනයක් සිදුකරන බව දන්වා තිබුණ ද විමර්ශනයක් සිදුකර ඇති බවට නිරීක්ෂණය නොවේ. තවද පැමිණිල්ල සිදු කළ පාර්ශවය සහ වගඋත්තර පාර්ශවය යන පාර්ශවයන් දෙකම එකම අවස්ථාවේ කැඳවා කරුණු විමසීම සිදුකළ යුතු වුවත්, කලාප කාර්යාලය විසින් සිදුකර ඇත්තේ වගඋත්තර පාර්ශවය පමණක් කැඳවා අවවාද ලබාදීම පමණි. එම ක්‍රියාව තුළ අගතියටපත් වූ වින්දි දරුවා සම්බන්ධයෙන් විනිවිදභාවයකින්, හා අපක්ෂපාතී භාවයකින් තෙවන වගඋත්තරකරු කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවේ. කෙසේ නමුත් වින්දිත දරුවාට වෙනත් පාසලකට යාම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල සහයෝගය පැමිණිලිකාර මවගේ ඉල්ලීම පරිදි ඉටුකර දී ඇති බව පෙනීයයි.

- සිව්වන වගඋත්තර පාර්ශවය වන හොරණ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති විසින් 2025.03.12 දින ස්ථානයට ලද පැමිණිල්ල විමර්ශනය කිරීම්දී මන්දගාමී ක්‍රියාකලාපයක් අනුගමනය කර ඇති බව නිරීක්ෂණය වේ. 2025.03.15 දින දෙපාර්ශවයන් කැඳවා ප්‍රකාශ ලබාගත් පසු නැවත සාක්ෂි කැඳවීම 2025.05.10 දින සිදුකර තිබේ. මාස දෙකකට ආසන්න කාලයක් තුළ මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු නොකර සිට ඇති අතර, කොමිෂන් සභාව විසින් 2025.04.25 දිනැතිව ස්ථානාධිපති හොරණ පොලිස් ස්ථාන වෙත මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් වාර්තාවක් යොමුකරන ලෙස ලිඛිතව දැනුම්දීමෙන් පසු, මෙකී පැමිණිල්ලට අදාළ සාක්ෂි කැඳවා සටහන් කර ගැනීම සිදුකර ඇති බව පෙනීයයි. ඒ අනුව දරුවන් සම්බන්ධයෙන් වන පැමිණිලි විභාගයේදී විශේෂ අවධානයක් යොමු කළ යුතු වුවද, හොරණ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය නිලධාරීන් විසින් මෙකී පැමිණිල්ලේ විමර්ශන කටයුතු සම්බන්ධයෙන් අඩු අවධානයක් ලබාදී ඇති බැවින් එම නිලධාරීන් නිසි වගකීමකින් යුතුව කටයුතු කර නොමැති බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

**නිගමනය:**

- 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද "ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි" (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස 1991 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී. එකී ළමා අයිතිවාසිකම් සම්මුතියේ 37 වන වගන්තියෙහි, "රාජ්‍ය පාර්ශවයන් සහතික කළ යුත්තේ: (අ) කිසිම දරුවෙකු වධහිංසාවට හෝ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමානකාරී සැලකිලි හෝ දඬුවම්වලට ලක් නොකළ යුතුය" යනුවෙන් සඳහන් කර තිබේ. එවන් වූ පසුබිමක මෙකී පැමිණිල්ල අනුව අගතියටපත්ව ඇත්තේ වයස අවුරුදු 08 ක් 03 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවෙක් බව පෙනීයයි. මෙම පැමිණිල්ලට අදාළ සියලුම සාක්ෂි කොමිෂන් සභාව විසින් විමර්ශනයට ලක්කරන ලදි. ඒ අනුව ප්‍රධාන වගඋත්තරකරු වන කේ. වී. ශාලිකා මදුවන්ති මිය විසින් කේශාන් පසිදු ශාමින්ද යන වින්දිත දුවාට පාසල තුළ දී පහරදී ඇති බවට ඉහත දක්වන ලද සියලුම සාක්ෂි අනුව සනාථ වී තිබේ. එමෙන්ම පළමුවන වගඋත්තරකරු පන්තිභාර ගුරුවරිය ලෙස 02 ශ්‍රේණියේ ඉගැන්වීම් කටයුතු කරන ලද කාලය තුළ දරුවා මානසිකව අපහසුතාවයට පත්වන ආකාරයෙන් කටයුතු කර ඇති බව ද පෙනීයයි. මන්දයත් වින්දිත දරුවා 03 ශ්රේණියට ඇතුළත් වූ පසු ඉගෙනුම් කටයුතු වලට දක්වන ලද උනන්දුව සහ පාසල් යාම 02 ශ්‍රේණියේ සිටි කාලය තුළ තිබී නොමැතිවීම වේ. මෙකී කරුණු පළමුවන වගඋත්තරකරුගේ ප්‍රකාශය මගින් ද, 03 ශ්රේණිය පන්තිය භාර ගුරුවරියගේ ප්‍රකාශය මගින් ද, වින්දිත දරුවාගේ හා දෙමාපියන්ගේ ප්‍රකාශ මගින් ද සනාථ වේ. ඒ අනුව පළමුවන වගඋත්තරකරු වන කේ. වී. ශාලිකා මදුවන්ති මිය වින්දිත දරුවා සම්බන්ධයෙන් අනුගමනය කටයුතු කරන ලද ආකාරය ගුරුවරියකට උචිත නොවන ක්‍රියාකලාපයක් බව පෙනීයයි.

- මෙකී පැමිණිල්ල කොමිෂන් සභාවට යොමුකිරීමට තුඩුදුන් වින්දිත දරුවාට පහරදීම සම්බන්ධයෙන් සොයාබැලීමේදී, වින්දිත දරුවා විසින් පාසලේ ක්‍රීඩා පිටියේදී නර්ථන පුහුණුවීම් කටයුතු වල නිරතවන අතරතුර, එම දරුවාගේ ඇගේ වැදී තවත් සිසුවියක් බිම වැටීම වේ. දරුවන් සියයකට වැඩි පිරිසක් එකම ස්ථානයක නර්ථන පුහුණුවීම් කටයුතු වල නිරතවී ඇති අතර, එකිනෙකාගේ ඇගේ වැදීම වැනි සිදුවීමක් සිදුවිය හැකි පරිසරයක් එම ස්ථානයේ තිබී ඇති අතර, කිසියම් ආකාරයක දඬුවමකට යටත් කළ යුතු ආකාරයේ ක්‍රියාවක් නොවන බව පෙනීයයි. ඒ අනුව මෙම සිදුවීමේදී පළමුවන වගඋත්තරකරු විසින් කරුණු විමසීමකින් හෝ සොයාබැලීමකින් තොරව සිය අභිමතය පරිදි කටයුතු කර ඇති බවත් කිසියම් දඬුවමකට යටත් කළ යුතු ආකාරයේ වරදක් වින්දිත දරුවා විසින් සිදුකර නොමැති බවත් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ. තවත මෙම සිදුවීමට පෙර සිටම පළමුවන වගඋත්තරකරු විසින් වින්දිත දරුවා සම්බන්ධයෙන් අනුගමනය කරන ලද පිළිවෙතෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම පහරදීම සිදුවී ඇති බව පෙනීයයි.

- ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2021 පෙබරවාරි 12 දින නිකුත් කළ SC/FR/97/2017 දරණ එච්. එම්. කරුණාපාල එදිරිව ජේ. පී. කේ. සිරිවර්ධන ඇතුළු පිරිස සම්බන්ධයෙන් වූ ප්‍රසිද්ධ නඩු තීන්දුවක් වන පුහුල්වැල්ල මධ්‍ය මහා විද්‍යාලයේ කලා ගුරුවරයා විසින් ශිෂ්‍යයෙකුට පහරදීම සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මගින්, ශාරීරික දඬුවම කොලනි යුගයේ ආරම්භ වූ ක්‍රියාවක් වන බවත්, නූතන ශ්‍රී ලාංකීය සමාජය තුළ එවැනි ක්‍රියාකරුවන්ට ඉඩක් නැති බවත් පෙන්දී තිබේ.

  *"It is thus clear, that those guiding and instructing impressionable children, do not set a suitable example in impulsively engaging in violent acts that harm children in the name of disciplining them, as children are only likely to carry forward this behavior. If teachers aim to instill self-discipline and non-violence in children, they must set the example by instilling the same values in themselves. While this is difficult practice, if one is to expect this of children, they are to reflect it and expect it of themselves."*

- තවද එකී තීන්දුව මගින් ඉහත දක්වා ඇති පරිදි, "ගුරුවරු යනු දරුවන්ට මග පෙන්වන සහ උපදෙස් දෙන පුද්ගලයින් වශයෙන්, හික්මවීමේ නාමයෙන්, ආවේගශීලීව දරුවන්ට හානි කරන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්හි යෙදීමෙන් සුදුසු ආදර්ශයක් නොදෙන බවත්, මන්ද දරුවන් මෙම හැසිරීම ඉදිරියට ගෙන යාමට ඉඩ ඇති බවත් සඳහන් කර තිබේ. ගුරුවරුන් දරුවන් තුළ ස්වයං විනය සහ අවිහිංසාව ඇති කිරීමට අරමුණු කරන්නේ නම්, ඔවුන් තමන් තුළම එම වටිනාකම් ඇති කිරීමෙන් ආදර්ශයක් තැබිය යුතුය. මෙය දුෂ්කර ප්‍රායෝගික ක්‍රියාවක් වුවද, යමෙකු දරුවන්ගෙන් මෙය අපේක්ෂා කරන්නේ නම්, ඔවුන් එය පිළිබිඹු කර තමන්ගෙන්ම එය අපේක්ෂා කළ යුතුය" යනුවෙන් නියෝග කර තිබේ.

- 2016.04.29 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 12/2016 හි 2.0 ශාරීරික දඬුවම් යන්නෙහි 2.1 යටතේ, "ශිෂ්‍යයින්ගේ ආරක්ෂාව සැලසීමේ දී දෙමාපියන්ට හා සමාන වගකීමක් ගුරුවරුන්ට ද හිමිවේ ය, යන සංකල්පය පදනම් කරගත් " in Loco Parantis " යන සංකල්පය පදනම් කර ගෙන පාසල තුළ දී අපේක්ෂිත චර්යාවන්ට නොගැළපෙන චර්යාවන් දක්වන සිසුන්ගේ එම අයෝග්‍ය චර්යාවන් වැළැක්වීම සඳහා ශාරීරිකව වේදනාවක් ඇතිවන අන්දමින් කරන දඬුවමක් ශාරීරික දඬුවමක් ලෙස හඳුන්වනු ලැබේ.......... ඒ නිසා සිසුවා තුළ චර්යාමය වෙනසක් අති කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් යුතුව වුව ද කිසිදු ශිෂ්‍යයෙකුට / ශිෂ්‍යාවකට ශාරීරිකව පීඩනයක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් වැළකී සිටීමට සියලුම දෙනා වගබලා ගත යුතු වේ" යනුවෙන් නීතිමය විධිවිධාන නිකුත් කර තිබේ.

- තවද එකී චක්‍රලේඛනයේ 2.4 වගන්තිය ප්‍රකාරව "පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුව ද සිසුන්ට දඬුවම් දීම සිදු කළහොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ග වලට මුහුණ දීමට

සිදුවනු ඇත" යනුවෙන් දක්වා ඇත. එමෙන්ම උක්ත චක්‍රලේඛනයෙහි 2.4 (i) හි දක්වා ඇති පරිදි, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා xvi පරිච්ඡේදයේ 126 වැනි වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැක" යනුවෙන් ද දක්වා ඇත. ඒ අනුව **2.4 (iii)** හි **"අධ්‍යාපනයට අදාළ බලධරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණ වලින් ශාරීරික දඬුවම් ලබාදී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැක" යනුවෙන් දක්වා ඇත. ඒ අනුව පළමුවන වගඋත්තරකරු වන කේ. වී. ශාලිකා මදුවන්ති මිය විසින් පැමිණිල්ලෙහි අගතියට පත් දරුවා වෙත ශාරීරික දඬුවම් ලබාදෙමින් පාසල් චක්‍රලේඛ අභිබවනය කරමින් කටයුතු කර ඇති බව නිගමනය කරනු ලැබේ. එකී ශාරීරික දඬුවම වින්දිත දරුවාගේ මානසික තත්ත්වය කෙරෙහි ද බලපා ඇති බව අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පෙනීයයි.**

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

**නිර්දේශ :**

1. මෙකී සිදුවීමට භාජනය වූ වින්දිත දරුවා වයස අවුරුදු 08 ක පමණ කුඩා දරුවෙක් වන බැවින් පළමුවන වගඋත්තරකරු වන කේ. වී. ශාලිකා මදුවන්ති මිය විසින් වින්දිත දරුවාගේ මව වන පැමිණිලිකාරිය වෙත රු. 10,000/- මුදලක් ගෙවිය යුතුය.

<u>**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව) විසින්,**</u>

2. පළමුවන වගඋත්තරකරු වන කේ. වී. ශාලිකා මදුවන්ති මිය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

3. දෙවන වගඋත්තරකරු වන ඩී. පී. ඒ. සී. විතානගේ මිය (විදුහල්පති) විසින් මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

4. තෙවන වගඋත්තර පාර්ශවය වන හොරණ කලාප අධ්‍යාපන කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රියාකර ඇති ආකාරය සතුටුදායක නොවන බැවින්, එකී නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

**<u>පොලිස්පතිවරයා විසින්,</u>**

5. සිවවන වගඋත්තරකරු වන හොරණ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති විසින් මෙම සිදුවීම වාර්තා වූ පසු විමර්ශන කටයුතු සිදුකර ඇති ආකාරය සම්බන්ධයෙන් කොමිෂන් සභාවට සෑහීමකට පත්විය නොහැක. එබැවින් එම නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

2025. ....07....31..... වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

1. අමාත්‍යතුමිය
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල. - කා.දැ.ගැ.ස.

2. ලේකම්
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල. - ඉහත නිර්දේශ ක්‍රියාත්මක කරවීම සඳහා

3. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
   අධ්‍යාපන දෙපාර්තමේන්තුව
   බස්නාහිර පළාත,
   නො. 89, කඩුවෙල පාර, බත්තරමුල්ල. - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම සඳහා

4. පොලිස්පති,
   පොලිස් මූලස්ථානය, කොළඹ 01. - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම සඳහා